ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය Business & Accounting Studies

| 60 | S | I, II |
|---|---|---|

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) තරග විභාගය 2022(2023 මාර්තු)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2022 (2023 மார்ச்)
Genaral Certificate of Education (Ord. Level) Examination, 2022 (March 2023)

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය I, II
வணிகக் கல்வியும் கணக்கீடும் I, II
Business and Accounting Studies I, II

පැය තුනයි
*Three hours*

## ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය II

වැදගත් :❖ උපදෙස් දී ඇති පරිදි ප්‍රශ්න 5කටපමණක් පිළිතුරු සපයන්න. ඊට වැඩියෙන් ලියා ඇති පිළිතුරු අයදුම්කරු විසින් කපා හැර නොමැති අවස්ථාවල දී ලකුණු නොකර ම කපා හරිනු ලැබේ.

- ❖ පළමුවන ප්‍රශ්නය ඇතුලුව I කොටසින් ප්‍රශ්න 2ක් ද, II කොටසෙන් ප්‍රශ්න 2ක් ද බැගින් තෝරාගෙන ප්‍රශ්න 5කට පමණක් පිළිතුරු සපයන්න.
- ❖ පිළිතුරු පැහැදිලි අත් අකුරින් ලියන්න.

01. පහත සඳහන් සිද්ධිය ඇසුරෙන් (i) සිට (x) දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

A ශ්‍රේණියේ මහා මාර්ගයක් අසල ජීවත්වන මන්සිළු ගමගේ අ.පො.ස. සා.පෙළ විභාගය අසමත් වීමෙන් පසු එයින් අධෛර්මත් නොවී ඔහු තම නිවස ඉදිරිපිට "මන්සිළු එළවළු" නමින් එළවළු වෙළෙඳ සැලක් 2022.01.01 දින ආරම්භ කරන ලදි. අවට ගම්වල ඉතා හොඳින් එළවළු හා පළතුරු වගා කරන නිසා තම පියාට අයත් ත්‍රී රෝද රථයෙන් පහසුවෙන් එළවළු සපයා ගැනීමට හැකියාව ලැබී ඇත. එම නිසා 2022.01.01 දින තම පියාට අයත් රු. 350,000 ක් වටිනා ත්‍රී රෝද රථය සහ ඉතිරි කරගත් රු. 180,000ක මුදල, ප්‍රාග්ධනය ලෙස ව්‍යාපාරයට යොදවන ලද අතර 2022.01.01 දින බැංකු ණයක් ද ලබා ගන්නා ලදි.

රජයේ රැකියාවක නියුතු විශාල පිරිසක් ව්‍යාපාරයට නුදුරින් ඇති බස් නැවතුම්පොළෙන් බැස ව්‍යාපාරය ඉදිරිපිට මාර්ගයෙන් නිවෙස් බලා ගමන් කරයි. මන්සිළු විසින් තම පාරිභෝගිකයන්ට රැගෙන යාමට පහසුවන ලෙස එළවළු මලු වලට දමා ඇසුරුම් කර සාධාරණ මිලකට ලබා දෙන නිසා ගමේ තවත් එළවළු වෙළෙඳ සැල් තිබුණ ද පාරිභෝගිකයෝ ඔහුගේ වෙළෙඳ සැලට ඇදී එයි. තම කටයුතු පහසුකර ගැනීම සඳහා මන්සිළු එක් සේවකයෙක් බඳවා ගන්නා ලදි. ඊළඟ මාසය තුළ පළතුරු කඩයක් ද ඇරඹීමට ඔහු තීරණය කල අතර ඒ සඳහා ශීතකරණයක් ද මිලට ගන්නා ලදි.

මන්සිළු ගමගේ ගිණුම් තැබීම ගැන අවබෝධයක් නොතිබු අතර 2022 ජනවාරි මාසය සඳහා ඔහු මුදල් පොත සකස් කර තිබුණේ මෙසේ ය.

**මුදල් පොත**

| | | | | | |
|---|---|---|---|---|---|
| 2022.01.01 | ප්‍රාග්ධනය | 180,000 | 2022.01.01 | බැංකු ණය | 80,000 |
| 2022.01.25 | එළවළු විකුණුම් | 55,000 | 2022.01.03 | ලී බඩු ගැණුම් | 20,000 |
| 2022.01.26 | එළවළු ණයට විකුණුම් | 15,000 | 2022.01.04 | ප්‍රචාරණ වියදම් | 2,000 |
| | | | 2022.01.05 | එළවළු ගැණුම් | 25,000 |
| | | | 2022.01.10 | එළවළු ණයට ගැණුම් | 10,000 |
| | | | 2022.01.25 | සේවක වැටුප් | 8,000 |
| | | | 2022.01.26 | ශීතකරණය ගැණුම් | 75,000 |
| | | | 2022.01.31 | ශේෂය ප/ගෙ | 30,000 |
| | | 250,000 | | | 250,000 |
| 2022.01.31 | ශේෂය ඉ/ගෙ | 30,000 | | | |

**අමතර තොරතුරු,**

- ❖ 2022.01.31 දිනට ඉතිරි එළවළු කිසිවක් නැත.
- ❖ බැංකු ණය පොලිය වාර්ෂිකව 12% වන අතර, ජනවාරි මාසයේ පොලිය තවමත් ගෙවා නැත.

(i) (අ) "මන්සිළු එළවළු" ව්‍යාපාරය නිෂ්පාදනය කරනු ලබන නිෂ්පාදිත වල ස්වභාවය අනුව කුමන ව්‍යාපාර වර්ගය අයත්වේද ?
(ආ) "මන්සිළු එළවළු" ව්‍යාපාරය කුමන ව්‍යාපාර සංවිධාන වර්ගයට අයත් වේද?
(ii) ඉහත සිද්ධියේ සඳහන් පහත සදහන් දෑ ශක්තීන්, දුර්වලතා, අවස්ථා හා තර්ජන වලට වෙන් කර දක්වන්න.
(A) මන්සිළු හට ගිණුම්කරණය පිළිබඳ ප්‍රමාණවත් දැනුමක් නොමැති වීම
(B) ගමේ තවත් එළවළු කඩ පිහිටා තිබීම.
(C) රජයේ රැකියාවල නියුතු පිරිස බහුලවීම
(D) ප්‍රාග්ධනය ලෙස ත්‍රීරෝද රථය සහ මුදල් යෙදවීම.
(iii) (අ) ඉහත සිදුවීමට අනුව මන්සිළු ගමගේ තොග වෙළෙදාමක යෙදේ. මෙම ප්‍රකාශයට ඔබ එකඟ වන්නේ ද ? හේතු දක්වන්න.
(ආ) මෙම ව්‍යාපාරයේ දැක්වෙන ප්‍රවාහන මූලිකාංග දෙක නම් කර, උදාහරණ එක බැගින් දක්වන්න.
(iv) (අ) A - සේවකයන් බඳවා ගැනීම
B - පළතුරු කඩයක් ඇරඹීමට තීරණය කිරීම.
ඉහත සිද්ධි දෙකට අදාළ කළමණාකරණ කාර්යයන් වෙන වෙනම දක්වන්න.
(ආ) ඉහත සිද්ධියේ දැක්වෙන අලෙවිකරණ විචල්‍යන් වන නිෂ්පාදිතය සහ ප්‍රවර්ධනයට අදාල උදාහරණ දෙකක් උපුටා දක්වන්න.
(v) 2022.01.31 දිනට මෙම ව්‍යාපාරයේ මුදල් පොත නිවැරදි කර තුලනය කර දක්වන්න.
(vi) නිවැරදි කළ මුදල් පොතට හා සිද්ධියේ සඳහන් තොරතුරු වලට අනුව 2022.01.01 දිනට ව්‍යාපාරයේ ගිණුම් සමීකරණය ඉදිරිපත් කරන්න.
(vii) (අ) 2022 ජනවාරි මාසයට අදාල බැංකු ණය පොලිය ගණනය කරන්න.
(ආ) උපචිත බැංකු ණය පොලිය ගිණුම්ගත කිරීමට අවශ්‍ය ජ'නල් සටහන ලියා දක්වන්න.
(viii) මන්සිළු එළවළු ව්‍යාපාරයේ ලෙජරයේ දැක්වෙන වත්කම්, වගකීම්, වියදම් හා හිමිකම් ගිණුම් වර්ග සඳහා උදාහරණය බැගින් සපයන්න.
(ix) 2022.01.31 මෙම ව්‍යාපාරයේ ශුද්ධ ලාභය ගණනය කරන්න.
(x) 2022.01.31 දිනට මෙම ව්‍යාපාරයේ හිමිකම ගණනය කරන්න.

## I **කොටස - ව්‍යාපාර අධ්‍යයනය**

(ප්‍රශ්ණ **දෙකකට** පමණක් පිළිතුරු සපයන්න.)

02. (i) අ. පුද්ගලයෙකු තම අවශ්‍යතා හා වුවමනා සපුරාගත හැකි ආකාර දෙකක් ලියන්න.
ආ. භාණ්ඩ හා සේවා අතර වෙනස්කම් දෙකක් දක්වන්න.
(ii) පහත සදහන් ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය ද යන්න දක්වන්න.
අ. භාණ්ඩ හා සේවාවල ගුණාත්වය ඉහළ නැංවීම ව්‍යාපාරයක උප අරමුණකි.
ආ. සිල්ලර හා තොග වෙළෙඳ ආයතන භාණ්ඩ නිෂ්පාදන ව්‍යාපාරයකට නිදසුනකි.
ඉ. ව්‍යාපාර අරමුණු ඉටුකර ගැනිමට අවශ්‍ය තීරණ ගැනීම හා එම තීරණ ක්‍රියාත්මක කිරිම කළමණාකරුවන්ගේ අරමුණකි.
ඊ. ජාත්‍යන්තර වෙළෙඳ ගිවිසුම්, වෙළෙඳ කලාප මගින් ජාත්‍යන්තර සබඳතා ඇති කර ගැනිම දේශපාලන පරිසරයට අයත් වේ.
(iii) ලහිරු තම ගෙවත්තේ හා අසල්වැසි වතුපිටි වලින් සපයා ගන්නා ලද ශාක කඳන්, අතු මුල්, වැල් වලින් තම මිතුරෙකු වන දිල්ශාන් ගේ ද සහය ඇතිව, විවිධ විසිතුරු රුක් කලා නිර්මාණය කොට A-9 ප්‍රධාන මාර්ගයට මුහුණලා ඇති කඩ කාමරයක තබා දෙස් විදේශ සංචාරකයින්ට අළෙවි කරයි.
අ. මෙම සිද්ධියේ සඳහන් නිෂ්පාදන සාධක දෙකක් ලියන්න.
ආ. ඔබ සඳහන් කල නිෂ්පාදන සාධක සඳහා උදාහරණය බැගින් ලියන්න.
(iv) චන්න ප්‍රධාන පාසල් කිහිපයක් ආසන්න ස්ථානයක පාසල් ලිපිද්‍රව්‍ය මුද්‍රිත පොත්පත් අළෙවිකිරිමේ වෙළෙඳ සැලක් පවත්වාගෙන යයි. දෛනිකව ලිපිද්‍රව්‍ය මිලට ගැනීමට එන පාසල් සිසුන් සංඛ්‍යාව වැඩිවෙමින් පවතී.
අ. චන්නගේ ව්‍යාපාරයට ඇති අවස්ථාවක් නම් කරන්න.
ආ. මොහුගේ ව්‍යාපාරයේ තිබිය හැකියැයි නිගමනය කලහැකි දුර්වලතාවයක් නම් කරන්න.

(ලකුණු 08 යි)

03. (i) ව්‍යාපාර සංවිධාන වර්ග කිරීමේ දී විවිධ නිර්ණායක යොදා ගනී. අරමුණ අනුව ව්‍යාපාර සංවිධාන වර්ග කර දක්වන්න.

(ii) පහත සඳහන් ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය ද යන්න දක්වන්න.

අ. හවුල් ව්‍යාපාරවල හවුල් කරුවන් සංඛ්‍යාව තීරණය කරන්නේ 1890 හවුල් ආඥා පණතට අනුව ය.

ආ. රාජ්‍ය සංස්ථා, අයිතිය සම්පූර්ණයෙන්ම රජය සතු ව්‍යාපාර සංවිධානයකි.

ඉ. ස්ථාවර තැන්පතුවක මුදල් කල් පිරීමට පෙර ආපසු ලබා ගැනීමේ හැකියාවක් ඇත.

ඊ. තොග වෙළෙඳාමක්, සිල්ලර වෙළෙඳාමක් යන්න ගැණුම්කරුගේ චේතනාව මත තීරණය වේ.

(iii) අ. කැකිරාව මහජන බැංකු ගිණුම් හිමිකරුවකු වන සමන් අනුරාධපුර ලංකා බැංකුවේ ගිණුමක් හිමි පියල්ට රු. 50,000ක චෙක්පතක් යැවිය යුතුය. මෙම චෙක්පතට උපරිම ආරක්ෂාව ලැබෙන පරිදි රේඛණය කරන්න.

ආ. රක්ෂණය සම්බන්ධයෙන් තෙවන පක්ෂය හඳුන්වන්න.

(iv) අ. 11 ශ්‍රේණියේ ශිෂ්‍ය ශිෂ්‍යාවන් 100 කට නුවරඑළිය සහ ඒ අවට නැරඹීම සඳහා අධ්‍යාපන චාරිකාවක් සූදානම් කර ඇත. මේ සඳහා සුදුසු මාධ්‍යයක් තෝරා ගැනීමේ දී සලකා බැලිය යුතු සාධක 02ක් ලියන්න.

ආ. සන්නිවේදන ක්‍රියාවලිය එහි මූලිකාංග මත රැඳී පවතී. සන්නිවේදන මූලිකාංග රූප සටහනක ඇඳ දක්වන්න.

(ලකුණු 08 යි)

04. (i) අ. අලෙවිකරණය යන්නෙන් අදහස් කරන්නේ කුමක් ද ?

ආ. අලෙවිකරණ මිශ්‍රණයට අදාල විචල්‍යන් නම් කරන්න.

(ii) පහත සඳහන් ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය ද යන්න දක්වන්න.

අ. ආයෝජනයක අවදානම පහල යන විට අපේක්ෂිත ප්‍රතිඵලය ද පහල යයි.

ආ. අන්තර්ජාලය හරහා සම්බන්ධ වන වෙළෙඳ පොළ "වෙලෙඳ පොළ අවකාශය" ලෙසද හැඳින්වේ.

ඉ. නිෂ්පාදිතයා තම නිෂ්පාදිත තොග වෙළෙඳුන්, සිල්ලර වෙළෙඳුන් මගින් පාරිභෝගිකයාට බෙදාහැරීම සෘජු වෙළෙඳාම වේ.

ඊ. ව්‍යාපාර අරමුණු අපේක්ෂිත අයුරින් ඉටු කර ගැනීම සඵලදායකත්වය වේ.

(iii) අභ්‍යාස පොත් නිෂ්පාදනය කරන ව්‍යාපාරයක් විසින් අනුගමනය කළ පියවරයන් කිහිපයක් පහත දැක්වේ.

අ. නිෂ්පාදිත අභ්‍යාස පොත්වල නිසි ගුණාත්වයක් ඇත්දැයි සොයා බැලීම

ආ. දිගුකාලීන ණයක් ලබා ගැනීමට තීරණය කිරීම.

ඉ. අභ්‍යාස පොත් අලෙවි කටයුතු උදෙසා ප්‍රාදේශීය අලෙවිකරුවන් බඳවා ගැනීම.

ඊ. ප්‍රාදේශීය අලෙවිකරුවන් උදෙසා තොරතුරු හා උපදෙස් ලබා දීම.

ඉහත පියවර කළමණාකරණ ක්‍රියාවලියේ එක් එක් කාර්යය යටතේ දක්වන්න.

(iv) අ. කොටස් වෙළෙඳ පොළ කටයුතු අධීක්ෂණය කරනු ලබන ආයතනය කුමක් ද?

ආ. ආයෝජන මාර්ගයක් තෝරා ගැනීමේ දී සලකා බැලිය යුතු කරුණු දෙකක් සඳහන් කරන්න.

(ලකුණු 08 යි)

## II **කොටස - ගිණුම්කරණය**

(**ප්‍රශ්ණ දෙකකට** පමණක් පිළිතුරු සපයන්න.)

05. (i) අ. ගිණුම්කරණයේ ප්‍රධාන අරමුණ කුමක් ද ?

ආ. ලෙජරය යනු කුමක් ද ?

(ii) පහත සඳහන් ගනුදෙනු සඳහා ද්විත්ව සටහන් ලියන්න.

අ. ව්‍යාපාරයේ පරිහරණයට රු. 100,000 උපකරණ "සයුර සමාගමෙන්" ණයට ගැනීම.

ආ. අයිතිකරුගේ පෞද්ගලික රක්ෂණ වාරිකය වු රු. 10,000 ව්‍යාපාරයේ මුදලින් ගෙවීම.

(iii) අමල්ගේ ව්‍යාපාරයේ 2023 ජනවාරි මාසයේ සිදුවු ගනුදෙනු කිහිපයක් පහත දැක්වේ.

1. රු. 250,000 ක ප්‍රාග්ධනයක් යෙදවීම.
2. රු. 50,000ක බැංකු ණයක් ලබා ගැනීම.
3. අත්පිට ගැණුම් රු. 80,000 කි.
4. දුරකථන ගාස්තු ගෙව්වා රු. 7,500
5. රු. 60,000 ක භාණ්ඩ තොගයක් රු. 80,000කට විකිණීම.

පහත සඳහන් වගුව පිළිතුරු පත්‍රයේ පිටපත් කරගෙන අංක 01 ගනුදෙනුව උදාහරණයට ගෙන ඉතිරි ගනුදෙනු සමීකරණයට බලපාන අයුරු දක්වන්න.

| ගනුදෙනු | වත්කම් | | = | හිමිකම් + | වගකීම් |
|---|---|---|---|---|---|
| අංකය | බඩුතොගය | ණයගැතියෝ | මුදල් | ප්‍රාග්ධනය | බැංකු ණය |
| 01. | - | - | + 250,000 | + 250,000 | |
| 02. | | | | | |
| 03. | | | | | |
| 04. | | | | | |
| 05. | | | | | |

(iv) සරණිගේ ව්‍යාපාරයේ සුළු මුදල් අග්‍රිමය රු. 3,000 කි. 2023 ජනවාරි මාසයේ සිදුවූ සුළු වියදම් පහත දැක්වේ.

| | | |
|---|---|---|
| 2023.01.01 | ශේෂය ඉ/ගෙ | 400 |
| 2023.01.01 | අග්‍රිමය ලැබුණා | |
| 2023.01.03 | සංග්‍රහ වියදම් | 270 |
| 2023.01.07 | කඩදාසි ගත්තා | 350 |
| 2023.01.10 | පෑන් 10ක් ගත්තා | 200 |
| 2023.01.13 | ගෙනඒමේ කුලි | 450 |
| 2023.01.16 | සංග්‍රහ වියදම් | 250 |
| 2023.01.20 | ලිපිද්‍රව්‍ය වියදම් | 140 |
| 2023.01.24 | බස් ගාස්තු | 120 |
| 2023.01.28 | මුද්දර ගාස්තු | 150 |
| 2023.01.30 | මුදල් ගැනිලි | 400 |
| 2023.02.01 | සුළු මුදල් අග්‍රිමය ප්‍රතිපූර්ණය කළා. | |

ලිපිද්‍රව්‍ය, ගමන්, තැපල් හා සංග්‍රහ විශ්ලේෂණ තීරු සහිතව ජනවාරි මාසයට අදාල සුළු මුදල් පොත පිළියල කරන්න. (ලකුණු 12 යි)

06. (i) අ. පොදු ජ'නලයේ සටහන් කරන ගනුදෙනු දෙකක් සටහන් කරන්න.
ආ. බැංකු අයිරාවක් යනු කුමක් ද ?

(ii) අරුණිගේ ව්‍යාපාරයේ 2022 මාර්තු මාසය සඳහා පිළියෙළ කළ බැංකු ගිණුමේ ශේෂය රු. 23,600ක් වූ අතර බැංකු ප්‍රකාශයේ ශේෂය ඊට වෙනස් විය. වෙනසට හේතු පහත පරිදි වේ.

- ❖ නිකුත් කළමුත් ගෙවීම සඳහා ඉදිරිපත් නොවූ චෙක්පත් රු. 16,000.
- ❖ බැංකුව අය කළ බැංකු ගාස්තු රු. 1,800 හා ස්ථාවර නියෝග අනුව බැංකුව ගෙවූ රක්ෂණය රු. 4,000 කි.
- ❖ ණයගැති ප්‍රේෂණ රු. 17,000 යි.
- ❖ තැන්පත් කළමුත් උපලබ්ධි නොවූ චෙක්පත් රු. 9,000 යි.

**අවශ්‍ය වන්නේ,**
අ. සංශෝධිත බැංකු ගිණුම
ආ. 2022 මාර්තු 31 දිනට බැංකු සැසඳුම් විස්තරය පිළියෙළ කරන්න.

(iii) අත්බෑග් නිෂ්පාදනය කිරීමේ ව්‍යාපාරයක් කරගෙන යනු ලබන ව්‍යාපාරයේ වියදම් පහත වේ.

| | |
|---|---|
| සම් මිලට ගැණුම් | රු. 45,000 |
| සිප් හා අනෙකුත් ද්‍රව්‍ය | රු. 2,000 |
| අත් බෑග් නිපදවන්නාගේ වැටුප | රු.7,000 |
| කම්හල් ගොඩනැගිලි කුලි | රු. 10,000 |
| කම්හල් විදුලිය | රු. 2,000 |

**අවශ්‍ය වන්නේ,**
අ. ප්‍රාථමික පිරිවැය
ආ. නිෂ්පාදන පිරිවැය සොයන්න.

(iv) ගුණරත්නගේ ව්‍යාපාරයේ 2022.12.31 දිනට පිළියෙළ කළ ශේෂ පිරික්සුමේ එකතුව සම නොවූ අතර එහි වෙනස රු. 38,000 ක් අවිනිශ්චිත ගිණුමට බැර කරන ලදි. ගිණුම් පොත් පරීක්ෂා කිරීමේ දී පහත වැරදි අනාවරනය විය.

A - රු. 8,000 ක විදුලි බිල ගෙවීම සටහන්ව ඇත්තේ මුදල් පොතේ පමණි.
B - විකුණුම් ගිණුමේ ශේෂය රු. 36,000 ශේෂ පිරික්සුමේ සටහන්ව නොතිබීම.
C - ණයගැති පාරමීගෙන් ලද රු. 5,000 පාරමීගේ ගිණුමේ හරට සටහන් කර තිබීම.

**අවශ්‍ය වන්නේ,**
අ. ඉහත වැරදි නිවැරදි කිරීමට අදාල ජනල් සටහන්
ආ. අවිනිශ්චිත ගිණුම පිළියෙල කරන්න. (ලකුණු 12 යි)

07. (i) ලාභ අරමුණු කර නොගත් සංවිධානවල ආදායම් ප්‍රකාශය හා ලැබීම් ගෙවීම් ගිණුම අතර ඇති වෙනස්කම් දෙකක් ලියන්න.

(ii) දිළෙනතරු ක්‍රීඩා සමාජයේ සාමාජික සංඛ්‍යාව 200ක් වන අතර එක් සාමාජිකයකුගේ වාර්ෂික සාමාජික මුදල රු. 100 කි. ක්‍රීඩා සමාජයේ 2022.12.31 දිනට ලැබීම් හා ගෙවීම් වලට අදාල තොරතුරු පහත දැක්වේ.

| | |
|---|---|
| ක්‍රීඩා පිටි නඩත්තු වියදම් | 10,000 |
| ක්‍රීඩා උපකරණ මිලට ගැනීම | 20,000 |
| විදුලි ගාස්තු | 5,000 |
| රජයේ පරිත්‍යාග ලැබීම් | 40,000 |
| තරඟ තීරක ගාස්තු | 2,000 |
| සංදර්ශණ ආදායම් | 60,000 |

2022 වර්ෂය තුළ සාමාජික මුදල් ගෙවා ඇත්තේ සාමාජිකයින් 180 ක් පමණි.

**අවශ්‍ය වන්නේ,**

2022.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලැබීම් හා ගෙවීම් ගිණුම පිළියෙළ කරන්න.

(iii) අපේක්ෂාගේ ව්‍යාපාරයේ 2022.12.31 දිනට ශේෂ පිරික්සුම පහත දැක්වේ.

**ශේෂ පිරික්සුම**

| | හර (රු) | බැර (රු) |
|---|---|---|
| ප්‍රාග්ධනය | | 200,000 |
| විකුණුම් | | 254,000 |
| 01.01.2022 තොගය | 10,000 | |
| ගැණුම් | 100,000 | |
| ගෘහ භාණ්ඩ උපකරණ | 180,000 | |
| ගෘහ භාණ්ඩ ක්ෂය වෙන් කිරිම. | | 18,000 |
| ගෙනඒමේ කුලි | 4,000 | |
| රක්ෂණ ගාස්තු | 1,000 | |
| ගොඩනැගිලි | 200,000 | |
| පරිපාලන වේතන | 6,000 | |
| ණයගැතියෝ | 20,000 | |
| ණයහිමියෝ | | 15,000 |
| දුන් වට්ටම් | 2,000 | |
| 10% බැංකු ණය | | 60,000 |
| කොමිස් ආදායම | | 6,000 |
| බැංකු ණය පොලිය | 3,000 | |
| මුදල් | 18,000 | |
| බොල් ණය | 9,000 | |
| | 553,000 | 553,000 |

**අමතර තොරතුරු**

1. 2022.12.31 දිනට තොගය 20,000
2. ගෘහභාණ්ඩ උපකරණ වාර්ෂිකව 10% බැගින් සරල මාර්ග ක්‍රමයට ක්ෂය කළ යුතුය.
3. වර්ෂයට අදාළ කොමිස් ආදායම රු. 9,000 කි.

**අවශ්‍ය වන්නේ,**

1. 2022.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභ හෝ අලාභ ප්‍රකාශනය
2. 2022.12.31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශනය.

(ලකුණු 12 යි)